# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 33 දරන පලාත් පාලන ණය සහන සභා පනත

---

[සහතිකය සටහන් කළේ 1983 සැප්තැම්බර් මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 සැප්තැම්බර් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 55 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 33 දරන පළාත් පාලන ණය සහන සභා පනත

[සහතිකය සටහන් කළේ 1983 සැප්තැම්බර් මස 07 වන දින]

එල්. ඩී.—ඕ. 20/81

**තම සාමාජිකයන්ට ණය දීමේ, සකසුරුවම් ලෙස හා ඔවුන්ගේ ආදායම් නොඉක්මවන ලෙස ජීවත්වීමට ශික්ෂණයක් ලබාදීමේ හා සහායවීමේ සහ තම සාමාජිකයන් අතර අරපිරිමැස්ම සහ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රගුණ කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන ආයතනවල සේවා නියුක්තයන් සඳහා ණය සහන සභා පිහිටුවීම පිණිස ද ඒ කරුණුවලට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1983 අංක 33 දරන පළාත් පාලන ණය සහන සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

**2.** (1) (මෙහි මින්මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන ණය සහන සභා දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

*පළාත් පාලන ණය සහන සභා දෙපාර්තමේන්තුව සහ අධ්‍යක්ෂවරයා.*

(2) (මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන ණය සහන සභා අධ්‍යක්ෂවරයකු සහ මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය වන පළාත් පාලන ණය සහන සභා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාවක් ද වෙනත් නිලධරයන් සහ සේවකයන් ද පත් කරනු ලැබිය හැකි ය.

**3.** (1) (මෙහි මින්මතු "ණය සහන සභාවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන ණය සහන සභා එකක් හෝ ඊට වැඩි ගණනක් එක් එක් පළාත් පාලන ආයතනයක පිහිටුවනු ලැබිය යුතු ය:

*පළාත් පාලන ණය සහන සභා සහ ඒවායේ සාමාජිකයෝ.*

එසේ වුවද පළාත් පාලන ආයතන එකකට වැඩි ගණනක් සඳහා එක් ණය සහන සභාවක් පිහිටුවීම අවශ්‍ය යයි සහ උචිත යයි අධ්‍යක්ෂවරයා කල්පනා කරන අවස්ථාවක ඔහු විසින් ඒ සඳහා බලය දිය හැකි ය.

(2) විශ්‍රාම වැටුප් හිමි හෝ අර්ථසාධක අරමුදලකට දායක වූ සෑම පළාත් පාලන ආයතනයක සේවා නියුක්තයකුම එම පළාත් පාලන ආයතනය සඳහා පිහිටුවනු ලැබූ ණය සහන සභාවේ සාමාජිකයකු විය යුතු ය.

**4.** 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව යම් පළාත් පාලන ආයතනයක් හෝ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වූ ණය සහන සභාවක් හෝ සභා පිහිටුවීමෙන් පසු, එසේ පිහිටුවනු ලැබූ ණය සහන සභාව හෝ සභා වෙනස් කිරීම අවශ්‍ය හා යෝග්‍ය යයි අධ්‍යක්ෂවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඔහු විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ඒ ණය සහන සභාව හෝ සභා

*ණය සහන සභා විසුරුවා හැරීම.*

2—ඒ 7902—16,650 (83/06)

විසුරුවා හැර එය හෝ ඒවා වෙනුවට, 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව, අවස්ථාවෝචිත පරිදි නව ණය සහන සභාවක් හෝ සභා පිහිටුවිය හැකි ය.

කළමනාකාර කාරක සභාව.

5. (1) ණය සහන සභාවක කටයුතු කළමනාකාර කාරක සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය. ඒ කාරක සභාව අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන සභාපතිවරයකුගෙන්, හා ලේකම්වරයකුගෙන් සහ සෑම සාමාජිකයන් පනස්දෙනා හෝ එයින් කොටසක් සඳහා ම තෝරා පත් කර ගනු ලැබූ එක් නියෝජිතයකුගෙන් සමන්විත විය යුතු නමුදු තෝරා පත් කර ගත් නියෝජිතයන්ගේ මුළු සංඛ්‍යාව විසි එක් දෙනකු නොඉක්මවිය යුතු ය :

එසේ වුවද, ණය සහන සභාවේ සාමාජිකයන්ගෙන් යම් විශේෂ කොට්ඨාසයක් හෝ පන්තියක් කළමනාකාර කාරක සභාවෙහි නියෝජනය වී නොමැති බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වුවහොත්, කළමනාකාර කාරක සභාවට, තෝරා පත් කර ගත් නියෝජිතයන්ට අතිරේකව, ඔහු විසින් නියෝජිතයන් තුන් දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් නම් කරනු ලැබිය හැකි ය.

(2) ණය සහන සභාවක කළමනාකාර කාරක සභාවේ සාමාජිකයන්, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(3) ස්වකීය කාර්ය කර ගෙන යාමේ දී අයථා පාලනය, වංචාව හෝ නොසැලකිල්ල පිළිබඳ හේතූන් සම්බන්ධයෙන් ණය සහන සභාවක කළමනාකාර කාරක සභාවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවස්ථාවෝචිත යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, ඔහු විසින් එසේ කළ හැකි ය. එවැනි ඉවත් කිරීමක් සම්බන්ධයෙන් කිසිම අධිකරණයක් විසින් ප්‍රශ්න නොකළ යුතු ය.

(4) (අ) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි, සිය කාර්ය කරගෙන යාමේ දී අයථා පාලනය, වංචාව හෝ නොසැලකිල්ල පිළිබඳ හේතූන් සම්බන්ධයෙන් හෝ නියමයේ නිශ්චිතව සඳහන් කළ යුතු යම් පරිපාලනමය කාර්ය සම්බන්ධයෙන් හෝ ණය සහන සභාවක කළමනාකාර කාරක සභාව විසුරුවා හැරීම අවස්ථාවෝචිත යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, ඔහු විසින් එසේ කළ හැකි ය. අමාත්‍යවරයා විසින් කරන ලද කිසිදු නියමයක් සම්බන්ධයෙන් කිසිම අධිකරණයක් විසින් ප්‍රශ්න නොකළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ යම් නියමයක් කරනු ලැබූ අවස්ථාවක, නව කළමනාකාර කාරක සභාවක් තෝරා ගනු ලැබිය යුත්තේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය අධ්‍යක්ෂවරයා විසින් තීරණය කළ යුතු ය.

(5) කළමනාකාර කාරක සභාවක ධුර කාලය තුළ දී ඇති විය හැකි යම් පුරප්පාඩුවක්, අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන නම් කිරීමක් මගින් පිරවිය හැකි ය. නම් කළ සාමාජිකයන්ගේ සංඛ්‍යාව, කිසිම අවස්ථාවක ඒ කාරක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් අඩක් නොඉක්ම විය යුතු ය. එවැනි කාරක සභාවකට නම් කරනු ලබන සාමාජිකයකු විසින් ඒ කාරක සභාවේ ධුර කාලයෙන් නොගෙවී ගිය කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

6. ණය සහන සභාවක කළමනාකාර කාරක සභාව විසින් ණය සහන සභාවේ නිශ්චිත කර්තව්‍ය කරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන අනුකාරක සභා පත් කරනු ලැබිය හැකි ය. අනුකාරක සභා පත් කිරීම.

7. (1) 5 වන වගන්තිය යටතේ ණය සහන සභාවක කළමනාකාර කාරක සභාවක් විසුරුවා හැර ඇති අවස්ථාවක, හෝ ණය සහන සභාවක් වෙනුවෙන් කළමනාකාර කාරක සභාවක් නොමැති අවස්ථාවක, 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, නව කළමනාකාර කාරක සභාවක සාමාජිකයන් පත් කරනු ලබන හා නම් කරනු ලබන තුරු, කළමනාකාර කාරක සභාවේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා සාමාජිකයන් පස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත අතුරු කළමනාකාර කාරක සභාවක් අධ්‍යක්ෂවරයා විසින් නම් කළ යුතු ය. අතුරු කළමනාකාර කාරක සභාව.

(2) අධ්‍යක්ෂවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ තමා නම් කළ තැනැත්තන් අතුරෙන් ඒ එක් එක් අතුරු කළමනාකාර කාරක සභාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා පත් කළ යුතු ය.

8. ණය කර්තව්‍ය කරගෙන යාමේ දී දෙපාර්තමේන්තුවට සහාය වීමේ කාර්යය සඳහා ණය සහන සභාවල සාමාජිකයන් වන තැනැත්තන් නව දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත උපදේශක කාරක සභාවක් අමාත්‍යවරයා විසින් පිහිටුවිය හැකි ය. යටත් පිරිසෙයින් ඒ කාරක සභාවල සාමාජිකයන් තිදෙනකු හෝ ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතිවල සාමාජිකයන් විය යුතු ය. උපදේශක කාරක සභාව.

9. (අ) සාමාජිකයන්ට ණය දීම ; ණය සහන සභාවල කර්තව්‍ය.

(ආ) දෙනු ලබන ණය, සාමාජිකයන්ගේ නියම නිර්ව්‍යාජ අවශ්‍යතාවන්ට පමණක් සීමාවන බවට වගබලා ගැනීම ;

(ඇ) දෙනු ලබන ණය ආපසු අයකර ගන්නා බවට වගබලා ගැනීම ;

(ඈ) සකසුරුවම් ලෙස හා තම ආදායම නොඉක්මවන ලෙස ජීවත්වීමට සාමාජිකයන්ට ශික්ෂණයක් ලබාදීම සහ ඊට සහාය වීම ;

(ඉ) සාමාජිකයන් අතර අරපිරිමැස්ම සහ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රගුණ කිරීම ;

(ඊ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි ණය සහන සභා සහ ඒවායේ කර්තව්‍යවලට සම්බන්ධ වූ ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමෙහි ලා සහාය වීම; සහ

(උ) ණයගැති වී සිටින සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීමෙහි ලා සහාය වීම,

ණය සහන සභාවල කර්තව්‍ය වන්නේ ය.

පළාත් පාලන ණය සහන සභා අරමුදල.

**10.** (1) දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලැබිය යුතු (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "පළාත් පාලන ණය සහන සභා අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවිය යුතු ය.

(2) (අ) ණය සහන සභාවල සාමාජිකයන්ගේ මාසික දායක මුදල් හා ඔවුන්ගෙන් කෙරෙන වෙනත් අයකර ගැනීම්;

(ආ) ණය සහන සභාවල වැඩ කටයුතු කිරීම සඳහා ඒකාබද්ධ අරමුදලින් වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ඇ) ණය සහන සභා මගින් උපයනු ලබන සියලු ලාභ, පොලී හා ලාභාංශ; සහ

(ඈ) අරමුදලට බැර කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් මුදල්

අරමුදලට බැර කළ යුතු ය.

(3) (අ) සාමාජිකයන්ට දෙනු ලබන ණය;

(ආ) සාමාජිකයන්ගේ දායක මුදල් ආපසු ගෙවීම්;

(ඇ) ඒකාබද්ධ අරමුදලට කෙරෙන ආපසු ගෙවීම්;

(ඈ) ඒකාබද්ධ අරමුදලින් ගෙවන ණය හා අත්තිකාරම් සම්බන්ධයෙන් වූ පොලිය;

(ඉ) රක්ෂණ අරමුදලට ගෙවිය යුතු යම් මුදලක්; සහ

(ඊ) මේ පනතේ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් ගෙවීම්

අරමුදලින් ගෙවිය යුතු ය.

(4) අරමුදලේ යම් අතිරික්ත මුදලක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ආකාරයකට ආයෝජනය කළ යුතු ය.

ඒකාබද්ධ අරමුදලින් දෙනු ලබන මුදල් ආපසු ගෙවීම.

**11.** ණය සහන සභාවල වැඩ කටයුතු කර ගෙන යාම සඳහා ඒකාබද්ධ අරමුදලින් දෙනු ලබන යම් මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි, ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

12. (1) ණය සහන සභාවක සෑම සාමාජිකයකු විසින් ම, සාමාජික දායක මුදල් වශයෙන් මාසයක් පාසා තමාගේ මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට එකක් සභාවට ගෙවිය යුතු ය. සාමාජික දායක මුදල්.

(2) ඒ සාමාජිකයාගේ සේවා නියුක්තිය අවසාන වූ විට, ඒ දායක මුදල් වෙනුවෙන් වූ යම් ලාභාංශයක් තිබුණහොත් ඒ ලාභාංශය ද සමග ඒ දායක මුදල් ඒ සාමාජිකයාට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද ඔහුගේ නාමිකයාට හෝ නාමිකයකු නොමැති වූ විට ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

13. ආපසු අය කර ගත නොහැකි ණය හේතුකොටගෙන ඇති වන යම් පාඩුවක් පියවීම පිණිස දෙපාර්තමේන්තුව විසින් රක්ෂණ අරමුදලක් ක්‍රියාත්මක කර පවත්වා ගෙන යා යුතු ය. රක්ෂණ අරමුදල.

14. (1) දෙපාර්තමේන්තුවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. අරමුදලේ ගිණුම්.

(2) අරමුදලේ ආදායම හා වියදම පිළිබඳ නිසි ගිණුම් පොත් නිතිපතා පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව විසින් සැලැස්වීය යුතු ය.

15. (1) නියමිත කරුණු සියල්ලටම හෝ ඒ කරුණු අතුරෙන් යම් කරුණකට අදාළව හෝ නියෝග සාදනු ලැබිය යුතු යයි නියමිත හෝ බලය දෙන ලද කරුණු සියල්ලම හෝ ඒ කරුණු අතුරෙන් යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් පවරනු ලබන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) කළමනාකාර කාරක සභාවක හෝ අතුරු කළමනාකාර කාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය ඇතුළුව රැස්වීම් පවත්වා ගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය හා සම්බන්ධ සියලු කරුණු ;

(ආ) කළමනාකාර කාරක සභාවකට නියෝජිතයන් තෝරා පත් කිරීම හා සම්බන්ධ සියලු කරුණු ;

(ඇ) ණය සහන සභාවල සාමාජිකයන්ට ණය දීම සහ ඒ ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් වූ සියලු කරුණු ;

(ඈ) අරමුදල පරිපාලනය කිරීම හා අරමුදලේ ගිණුම් පවත්වා ගෙන යාම ;

(ඉ) ඒකාබද්ධ අරමුදලින් දෙනු ලැබිය හැකි මුදල් ආපසු ගෙවීම ;

(ඊ) සාමාජික දායක මුදල් අයකර ගැනීම සහ ඒ මුදල් ආපසු ගෙවීම ;

(උ) සාමාජික දායක මුදල් මත ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම ;

(ඍ) රක්ෂණ අරමුදල පරිපාලනය කිරීම ; සහ

(එ) උපදේශක කාරක සභාවේ සභාපතිවරයා පත් කිරීම සහ රැස්වීම්වල කාර්ය පටිපාටිය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිතව දැක්වෙන වෙනත් පසු දින යක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එහි අනනුමත යේ දින සිට, එහෙත් එය යටතේ කලින් කරන ලද යම් දෙයකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**16.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

"පළාත් පාලන ආයතනයක සේවා නියුක්තයා" යන්නෙන්, පළාත් පාලන සේවයේ සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු සහ 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත මගින් පිහිටුවනු ලැබූ සංවර්ධන සභාවක යම් නිලධරයකු හෝ සේවකයකු අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණක් දායක මුදල් භාරගනු ලැබේ.